JMC vLearning
"your virtual learning partner"

# හවුල් ව්‍යාපාර

නුවන් සමීර

ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය
JMC JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD
Estd. 1972

JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Chittampalam Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917

හවුල් ව්‍යාපාරයක් යන්නෙන් ලිඛිතව සටහන් කරනු ලැබ තිබේද? යන්න නොතකා, ලාභ ලැබීමේ අරමුණ සඳහා හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන පුද්ගලයන් හෝ සංස්ථා දෙකක් හෝ ඊට වැඩි ගණනකින් යුත් සංගමයක් අදහස් වේ.

ඒ අනුව හවුල් ව්‍යාපාරයක පහත ලක්ෂණ දැකිය හැක.

1. ව්‍යාපාරයේ පැවැත්ම
2. දෙදෙනෙක් හෝ ඊට වැඩි ගණනක් හවුල්කරුවන් සිටීම
3. ලාභ ලැබීමේ අරමුණ පැවතීම

හවුල් ව්‍යාපාරයට නීතිය පුද්ගලභාවයක් නොමැත. හවුල් ව්‍යාපාරය බදු කාර්යය සඳහා අස්ථිත්වයක් ලෙස සලකනු ලැබේ.

## හවුල් ව්‍යාපාරයක වාසිකභාවය (Residence)

1. ශ්‍රී ලංකාව තුළ පිහිටුවනු ලද්දේ නම් හෝ
2. හවුල් ව්‍යාපාරයේ කටයුතු කළමනාකරණය සහ පරිපාලනය ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කර ඇත්නම්

එම හවුල් ව්‍යාපාරය එම තක්සේරු වර්ෂය තුළ ශ්‍රී ලංකාවේ වාසිකයෙකු වේ.

## ආදායම් බදු (Liability to Pay Tax)

- යම් තක්සේරු වර්ෂයක් සඳහා හවුල් ව්‍යාපාරයක ආදායම එම වසර සඳහා එහි ව්‍යාපාරයෙන් හෝ ආයෝජනයෙන් හවුල් ව්‍යාපාරය ලද ආදායම වේ.
- හවුල් ව්‍යාපාරය එහි බදු අය කල හැකි ආදායම සම්බන්ධයෙන් ආදායම් බද්ද ගෙවීමට යටත් නොවේ. නමුත් රඳවා ගැනීමේ ගෙවීම් සම්බන්ධයෙන් සහ ආයෝජන වත්කම් උපලබ්ධි වීමෙන් ඇතිවන ලැබීම් මත ආදායම් බද්ද ගෙවීමට යටත් වේ.
- හවුල්කරුවන් විසින් පොදුවේ උපයනු ලබන සහ පොදුවේ දරනු ලබන වියදම් හවුල්කරුවන් විසින් නොව එම හවුල් ව්‍යාපාරය විසින් උපයනු ලබන මුදල් හෝ දරනු ලබන වියදම් ලෙස සලකනු ලැබේ.
- හවුල්කරුවන් විසින් පොදුවේ අයිතිය දරනු ලබන වත්කම් සහ පොදුවේ දරනු ලබන බැරකම් හවුල් ව්‍යාපාරයේ වත්කම් හෝ හවුල් ව්‍යාපාරයේ බැරකම් ලෙස සලකනු ලැබේ.

## රඳවා ගැනීමේ බදු (Withholding tax)

හවුල් ව්‍යාපාරයේ ආදායමෙන් එක් එක් හවුල්කරුවන්ගේ කොටස මත 8% ක අනුප්‍රමාණයට හවුල් ව්‍යාපාරය විසින් රඳවා ගැනීමේ බද්ද ගෙවිය යුතුය.

හවුල් ව්‍යාපාරයක ආයෝජන වත්කම් උපලබ්ධි වීමෙන් ලද ලැබීම් මත කිසිදු රඳවා ගැනීමේ බද්දක් නොගෙවිය යුතුය.

## ඉටු කරන ලද සේවය සඳහා කලත්‍රයා ලබන ආදායම

යම් කලත්‍රයෙකුට

- අනෙක් කලත්‍රයා විසින් හෝ
- අනෙක් කලත්‍රයා හවුල්කරුවකු වන්නා වූ හවුල් ව්‍යාපාරයක් විසින් පවත්වාගෙන යනු ලබන හෝ ක්‍රියාත්මක කරනු ලබන යම් ව්‍යාපාරයක දී සපයන ලද සේවා වෙනුවෙන් ආදායමක් ලැබෙන අවස්ථාවක එම ආදායම, එම ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන කලත්‍රයාගේ ආදායමට හෝ
- එම අනෙක් කලත්‍රයා හවුල්කරුවෙකු වන ව්‍යාපාරයේ ආදායමට ඇතුලත් කරනු ලැබිය යුතුය.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

## උදාහරණ 01

A සහ B ලාභ සහ අලාභ 2 : 1 අනුපාතයට බෙදා ගනිමින් හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යයි. 2019/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභාලාබ ගිණුම.

| | රු. | |
|---|---|---|
| දල ලාභය | | 15,600,000 |
| ගැනිලි පොලී – B | | 50,000 |
| | | 15,650,000 |
| | | |
| අනිකුත් වියදම් | | 3,000,000 |
| B ගේ වැටුප් | | 2.000,000 |
| ණය පොලී – A | | 200,000 |
| ප්‍රාග්ධන පොලී | | |
| A | 150,000 | |
| B | 100,000 | 250,000 |
| ශුද්ධ ලාභය | | 10,200,000 |

1. හවුල් ව්‍යාපාරය ගෙවිය යුතු රඳවා ගැනීමේ බද්ද ගණනය කරන්න.
2. හවුල්කරු විසින් ගෙවිය යුතු බද්ද ගණනය කරන්න.

## උදාහරණ 02

සිරිසර ඇඳුම් ආනයනය කර විකිණීමේ නිරත හවුල් ව්‍යාපාරයකි. මෙහි හවුල්කරුවන් වන අමල් සහ පියල් ලාභාලාබ සමානව බෙදා ගැනීමටත්, හවුල්කරුවන් විසින් ප්‍රාග්ධනයට අමතරව ව්‍යාපාරයට සපයන ලද අරමුදල් සඳහා 5% බැගින් පොලියක් ලබා ගැනීමටත් එකඟ වූහ. 2019/03/31 න් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය පහත පරිදි වේ.

| | රු. |
|---|---|
| පිරිවැටුම | 15,500,000 |
| විකුණුම් පිරිවැය | (8,750,000) |
| දල ලාභය | 6,750,000 |
| සේවක වැටුප් | (660,000) |
| වත්කම් මත ක්ෂය | (250,000) |
| උපයෝගීතාව සේවා බිල්පත් | (60,000) |
| අමල් ලබා දුන් ණය සඳහා පොලිය | (70,000) |
| සුළු ද්‍රව්‍ය | (15,000) |
| ශුද්ධ ලාභය | 5,695,000 |

පහත අතිරේක තොරතුරු සපයා ඇත.

JMC vLearning "your virtual learning partner"

1. අමල්ගේ බිරිඳ වන කමනි මෙම ව්‍යාපාරයේ ප්‍රධාන ගණකාධිකාරිණිය ලෙස සේවය කරන අතර ඇයගේ මාසික වැටුප 25,000 කි. ඇයට ගෙවූ රු. 300,000 ක වැටුප හා පියල්ට ගෙවූ 100,000 වැටුප සේවක වැටුප් තුල ඇතුලත්ය.

2. 18/19 තක්සේරු වර්ෂය සඳහා බදු අරමුණු සඳහා වත්කම් ක්ෂය දීමනාව 100,000/- කි.

ඔබ විසින්,

a) හවුල් ව්‍යාපාරයේ බෙදිය හැකි ලාභය ගණනය කරන්න.

b) හවුල් ව්‍යාපාරය විසින් ගෙවිය යුතු රඳවා ගැනීමේ බද්ද ගණනය කරන්න.

c) හවුල් ව්‍යාපාරයෙන් පැන නඟින ලාභ සහ වෙනත් ආදායම් හවුල්කරුවන් අතර බෙදා ගැනීමේ ප්‍රකාශනයක් පිළියෙල කරන්න.

d) එක් එක් හවුල්කරුගේ 2018/19 තක්සේරු වර්ෂය සඳහා බද්ද ගණනය කරන්න.

JMC vLearning
© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd